**කර්මාන්ත සංවර්ධන අධිකාරිය (බස්නාහිර පළාත)**

**බස්නාහිර පළාත් මාර්ග, ප්‍රවාහන හා කර්මාන්ත අමාත්‍යංශය**

**<u>අභිලාෂය ප්‍රකාශ කිරීම සඳහා ඉල්ලීමයි</u>**

# (EOI)

**<u>බස්නාහිර පළාතේ පිවිතුරු නිෂ්පාදන ක්ෂේත්‍රයට අදාළ පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා සුදුසු ව්‍යවසායකත්ව ආයතනයක් තෝරා ගැනීම</u>**

**කර්මාන්ත සංවර්ධන අධිකාරිය (බස්නාහිර පළාත)**

**නිකුත් කළ දිනය:** 2026 ජූනි 03

**ඉදිරිපත් කිරීම් සඳහා අවසන් දිනය:** 2026 ජූනි 11

## 1. හැඳින්වීම

බස්නාහිර පළාතේ කර්මාන්ත සංවර්ධන අධිකාරිය (IDA), පළාත තුළ තිරසාර කර්මාන්ත වර්ධනය සහ පාරිසරික කළමනාකරණය පෝෂණය කිරීමට කැපවී සිටී. මෙම කැපවීම සමඟින්, බස්නාහිර පළාතේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායන් (MSMEs) සහ කර්මාන්තකරුවන් සඳහා පිවිතුරු නිෂ්පාදන සහ සම්පත් කාර්යක්ෂමතා හා පිවිතුරු නිෂ්පාදන තාක්ෂණයන් පිළිබඳ පුළුල් පුහුණු වැඩසටහන් ලබා දීම සඳහා සුදුසුකම් ලත් සහ පළපුරුදු පුහුණු සම්පත් දායකත්ව ආයතන සම්බන්ධ කර ගැනීමට බස්නාහිර පළාතේ කර්මාන්ත සංවර්ධන අධිකාරිය (IDA) අපේක්ෂා කරයි.

මේ සම්බන්ධව උනන්දුවක් දක්වන පාර්ශවයන්ට විශේෂිත පුහුණු වැඩසටහන් පැවැත්වීමට ඇති හැකියාව, අත්දැකීම් සහ ප්‍රවීණත්වය ප්‍රදර්ශනය කිරීමට සුදුසුකම් ලත් සම්පත් දායකත්ව ආයතනවලට ආරාධනා කරයි.

## 2. පුහුණු වැඩසටහන් වල අරමුණු

මෙම පුහුණු වැඩසටහන් වල ප්‍රධාන අරමුණු වන්නේ:

- පිවිතුරු නිෂ්පාදන ක්‍රමවේදයන් අනුගමනය කිරීම සඳහා MSMEs සහ කර්මාන්තකරුවන්ගේ දැනුම හා කුසලතා වැඩි දියුණු කිරීම.
- කර්මාන්ත මෙහෙයුම් වලදී සම්පත් කාර්යක්ෂමතාව, අපද්‍රව්‍ය අවම කිරීම සහ පරිසර දූෂණය වැළැක්වීම ප්‍රවර්ධනය කිරීම.

- පුනර්ජනනීය බලශක්තිය සහ හරිත ගොඩනැගිලි සංකල්ප ඇතුළුව තිරසාර තාක්ෂණයන් සහ ක්‍රමවේදයන් අනුගමනය කිරීමට පහසුකම් සැලසීම.
- බස්නාහිර පළාතේ කර්මාන්තවල සමස්ත පාරිසරික තිරසාරභාවය සහ ආර්ථික තරඟකාරිත්වය සඳහා දායක වීම.

## 3. කාර්යයේ විෂය පථය සහ අවශ්‍ය පුහුණු ක්ෂේත්‍ර

තෝරාගත් පුහුණු ආයතනය පහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පුහුණු මොඩියුල සංවර්ධනය කිරීම සහ ලබා දීම සඳහා වගකිව යුතුය.

1 කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන් 60 ක් සඳහා සම්පත් කාර්යක්ෂමතා හා පිවිතුරු නිෂ්පාදන (RECP) තාක්ෂණයන් පිළිබඳව පුහුණු වැඩමුළු 3ක් පැවැත්වීම.

2 ජෛව හායනයට ලක්වන ඇසුරුම් ද්‍රව්‍ය (කඩදාසි, ශාක කෙඳි ආදිය) නිෂ්පාදනය පිළිබඳව කර්මාන්තකරුවන්/ආධුනිකයන් 20ක් සඳහා ප්‍රායෝගික පුහුණු වැඩසටහන් 01 ක් පැවැත්වීම.

3 කර්මාන්තකරුවන් 20 ක් සඳහා ජල සුරක්ෂිතතා සහ ප්‍රතිචක්‍රීයකරණ ක්‍රමවේද පිළිබඳ පුහුණු වැඩසටහන් 1ක් පැවැත්වීම.

4 දේශගුණ-සුහුරු කෘෂි කර්මාන්තය පදනම් කරගත් සැකසුම් ක්‍රම හඳුන්වාදීම පිළිබඳව කර්මාන්තකරුවන්/ ආධුනිකයන් 50ක් සඳහා පුහුණු වැඩසටහන් 2ක් පැවැත්වීම. (සූර්ය වියළීම/solar heating & drying system හා ජෛව වායු බලශක්ති භාවිතය/ bio gas)

5 කර්මාන්තකරුවන් 20 දෙනෙකුගේ කර්.මාන්ත ආයතනවල බලශක්ති භාවිතය විශ්ලේෂණය කර බලශක්ති අපතේ යාම අවම කිරීම හා නිෂ්පාදන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම හා බලශක්ති පිරිවැය අඩු කිරීම සඳහා නිර්දේශ අඩංගු වාර්තා 20ක් ලබා දීම.

6 පැරණි යන්ත්‍රෝපකරණ දෙනෙක් සඳහා, භාවිතා කරන කර්මාන්තකරුවන් 20 දෙනෙක් සඳහා ඉහළ බල ශක්ති කාර්යක්ෂමතාව සහිත මෝටර් සහ වායු සම්පීඩක යන්ත්‍ර මඟින් පැරණි යන්ත්‍ර ප්‍රතිස්ථාපනය කිරීම පිළිබඳව පුහුණු වැඩසටහනක් පැවැත්වීම.

7 LED චලන සංවේදක ආලෝක (LED motion sensor light) පද්ධති ස්ථාපනය කිරීම සඳහා කර්මාන්තකරුවන් 30 දෙනෙක් සඳහා පුහුණු වැඩසටහනක් පැවැත්වීම.

8 කර්මාන්කරුවන් 40 දෙනෙක් සඳහා හරිත ගොඩනැගිලි (Green Building) මාර්ගෝපදේශ සහ සහතික හඳුන්වාදීම පිළිබඳ වැඩසටහන් 2ක් පැවැත්වීම.

9 පොසිල ඉන්ධන භාවිතා කරන කර්මාන්තකරුවන් 30 දෙනෙක් සඳහා තිරසර ජෛව ස්කන්ධ භාවිතයෙන් බලශක්ති පිරිවැය අවම කිරීම සහ පරිසර බලපෑම් අවම කිරීම සම්බන්ධ පුහුණු වැඩසටහන් පැවැත්වීම.

## 4. පුහුණු ආයතන සඳහා සපුරාලිය යුතු නිර්ණායක

උනන්දුවක් දක්වන සම්පත් දායකත්ව ආයතන පහත සඳහන් අවම නිර්ණායක සපුරාලිය යුතුය:

- සම්පත් කාර්යක්ෂම හා පිවිතුරු නිෂ්පාදනය (RECP), තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදනය (SCP) හෝ අදාළ ක්ෂේත්‍රවල අවම වශයෙන් වසර 10 ක පළපුරුද්ද. [Minimum 10 years of experience in Resource Efficient and Cleaner Production (RECP), Sustainable Consumption and Production (SCP), or related fields.]
- ලියාපදිංචි බලශක්ති සේවා සමාගමක් විය යුතුය (ESCO). [Registered Energy Service Company (ESCO)]
- වෘත්තීය ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් වල පෙන්නුම් කළ හැකියාව සහිත ලියාපදිංචි සම්පත්දායක ආයතනයක් වීම. [Registered Training Provider with demonstrated capability in professional capacity-building programs]
- බලශක්ති තක්සේරු කිරීම් සහ විගණන පැවැත්වීම සඳහා අභ්‍යන්තර බලශක්ති මිනුම් පුහුණු සංචිතයක් තිබීම. [Availability of an in-house energy measurement instrument bank for conducting energy assessments and audits]
- ආයතනය තුළ පිළිගත් බලශක්ති විගණකවරයෙකු වෙත ප්‍රවේශය තිබීම. [Access to an accredited Energy Auditor within the organization]
- CP, RECP සහ SCP පුහුණු වැඩසටහන්, වැඩමුළු සහ ධාරිතා ගොඩනැගීමේ මුලපිරීම් සැලසුම් කිරීම සහ ලබා දීම සම්බන්ධයෙන් ඔප්පු කළ වාර්තාවක්. [Proven track record in designing and delivering CP, RECP, and SCP training programmes, workshops, and capacity-building initiatives]

ඉහත අවශ්‍යතා සපුරාලන සම්පත්දායක ආයතන තම සුදුසුකම් සහ පළපුරුද්ද පෙන්නුම් කරන අදාළ ලියකියවිලි සමඟ තම තම අභිලාෂ ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

## 5. අභිලාෂය ප්‍රකාශ කිරීමේ ක්‍රියා පටිපාටිය

අභිලාෂය ප්‍රකාශ කිරීම (EOI) 2026 ජුනි 11 දින ප.ව.04.00ට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ ගෙනැවිත් භාර දීම කළ හැකිය. ප්‍රමාද වී ඉදිරිපත් කරන ලද ලිපි භාර නොගනු ලැබේ.

කර්මාන්ත සංවර්ධන අධිකාරිය (බස්නාහිර පළාත),
අංක 4-ඒ 1/1,
සෝරත මාවත,
ගංගොඩවිල,
නුගේගොඩ.

## 6. තෝරා ගැනීමේ ක්‍රියාවලිය

ඉදිරිපත් කිරීම් සුදුසුකම් නිර්ණායක සහ සම්පත්දායක ආයතනවල සහ ඔවුන්ගේ හැකියාව සහ පළපුරුද්ද මත පදනම්ව තෝරා ගැනීමට ලක් කෙරේ.

ස්තූතියි.

ප්‍රසන්න සුජිත් කුමාර
අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී
කර්මාන්ත සංවර්ධන අධිකාරිය (බ.ප)
අංක: 4ඒ-1/1, සෝරත මාවත,
ගංගොඩවිල, නුගේගොඩ.

ප්‍රසන්න සුජිත් කුමාර,
අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී,
කර්මාන්ත සංවර්ධන අධිකාරිය (බ.ප)



Scanned with CamScanner